## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

230

08 FEB 2022

1. සම්බන්ධ වන ආයතන
   1.1. දෙපාර්තමේන්තුව — යොමු අංකය — දිනය
   1.2. අමාත්‍යාංශය - බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය — යොමු අංකය - 1/6/25(II) — දිනය - 2021.09.13
   1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් - විසින් තනතුර අනුමත කිරීම — යොමු අංකය -DMS/D/පොදු 11-2 — දිනය - 2012.12.19
   1.4. ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය — යොමු අංකය CS/CP/PTR/12-5/F1/1 — දිනය 2021.10.07
   1.5. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය — දිනය
   1.6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය WPC/PSC/MNP/01/B/2021/2 — දිනය 2021.12.09
   1.7. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය — යොමු අංකය — දිනය

2. පත්කිරීම්

| | | |
|---|---|---|
| 2.1 | පත්කිරීමේ බලධරයා | - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 2.2 | ක්‍රියාත්මක වන දිනය | - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ. |

3. සේවා ගණය පිළිබඳ විස්තර
   3.1. සේවා ගණය - කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 02
   3.2. ශ්‍රේණි - III, II, I
   3.3. පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය -

   ආයතනයක විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවන් එනම්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) මට්ටම 5 හෝ 6 යටතට ගැනෙන්නා වූ ද පාඨමාලා කාලසීමාව මාස 13 සහ 24 අතර වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගතයුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටුකරනු ලැබිය යුතුය.

   3.4. කාර්යයන් පැවරීම -

   ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදුනොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

4. තනතුරේ ස්වභාවය - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය - MT 2- 2016 (රා.ප.ච.3/2016 අනුව)

5.2. වැටුප් පරිමාණය - 30140-350X10-370X11-560X10-660X10-49910

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | ආරම්භක පියවර | 30140.00 |
| II | පියවර 12 | 34010.00 |
| I | පියවර 23 | 38270.00 |

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ක්‍රීඩා නිලධාරි | III,II,I | 43 | 1. ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව පවත්වාගෙන යාම.<br>I. පුහුණු මධ්‍යස්ථානයට ලබාදී තිබෙන සියලු ම ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ නඩත්තු කිරීම.<br>II. පුහුණු මධ්‍යස්ථානයට අයත් සෙසු භාණ්ඩ හා දේපළ ආරක්ෂා කිරීම.<br><br>2. ක්‍රීඩා පුහුණු කිරීම, ඉදිරි වැඩසටහන් අනුව පවත්වාගෙන යාම.<br><br>3. ක්‍රීඩා විෂයට අදාළ සැලසුම්.<br>4.<br>I. ක්‍රීඩක ජීවදත්ත වාර්තා<br>II. ක්‍රීඩක කුසලතා වාර්තා<br>III. පර්යේෂණ වාර්තා<br>IV. ක්‍රීඩා පැමිණීමේ ලේඛන පවත්වාගෙන යාම.<br><br>5. ක්‍රීඩා තරග, පුහුණු කඳවුරු සංවිධානය හා තරග විනිශ්චය.<br><br>6. ක්‍රීඩා අධ්‍යක්ෂකගේ අනුමැතියට යටත්ව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව හෝ වෙනත් රාජ්‍ය නොවන පිළිගත් ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා ව්‍යාපෘතීන් සඳහා සහාය හා උපදෙස් ලබාදීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - උසස් කිරීමේ කාර්යය සඳහා සේවා ගණයේ III/ II /I ශ්‍රේණි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලිපි අංකය : GOS/ADM/06/6/372
දිනය : 2022.01.25

229
08 FEB 2022

7. බඳවාගැනීමේ ක්‍රමය -

7.1 බඳවාගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නැත |
| කුසලතා | අදාළ නැත |

7.2 විවෘත බඳවාගැනීම

7.2.1 බඳවාගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් -

(අ) I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

II. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාර්ථ ලබාගෙන තිබීම.
(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවත්වෙන තරගයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථානයන් ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගවල 1, 2 හෝ 3 ස්ථානයන් ලබා තිබීම.

හෝ

(ආ) I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

II. දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග නියෝජනය කර 1, 2, 3 ස්ථාන ලබා තිබීම හෝ ඔලිම්පික් තරග හෝ ලෝක ශූරතා තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම.

සංලක්ෂය:- <u>" ඉහත සඳහන් සුදුසුකම් යටතේ බඳවාගන්නා නිලධාරීන් වසර 03ක් ඇතුළත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ/හය (05/06) මට්ටමේ වන්නාවූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබාගැනීම, සේවාව ස්ථිර කිරීම සඳහා අනිවාර්යය වේ. මෙම සුදුසුකම සේවයට පැමිණීමට පෙර සපුරා ඇත්නම් අදාල ලේඛන පත්වීම් බලධරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාල අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. මෙම ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ/හය (05/06) මට්ටමේ වන්නාවූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් පළමු වසර තුන (03) තුළ ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය පරිවාස කාලය අවසානයේ දී ස්ථිර නොකරන අතර ඔවුන්ගේ වැටුප් වර්ධක විලම්බනය කරනු ලැබේ. එලෙස වැටුප් වර්ධක විලම්බනය කිරීමට භාජනය වූ නිලධාරියෙකු එසේ වැටුප් වර්ධක විලම්බනය කරන ලද දින සිට වසර දෙකක (02) කාලයක් තුළ ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ/හය (05/06) මට්ටමේ වන්නාවූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබාගැනීමට අසමත් වන්නේ නම්, ඔහුගේ පත්වීම පත්වීම් බලධරයා විසින් අකාර්යක්ෂමතාව මත අවසන් කළයුතුය.</u>

7.2.2.2 පළපුරුද්ද - අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ. (සහතික මගින් සනාථ කළයුතුය.)

7.2.2.3 කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකු ම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවක් තිබිය යුතුය. ශාරීරික යෝග්‍යතාව පිරික්සීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ පළාත් ක්‍රීඩා විද්‍යායතනයේ ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වියයුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය පහත අංශයන්ගෙන් සමන්විත ය. ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාව, උදරයේ ශක්තිය, දෑත්වල ශක්තිය,උලඟිතාව, හිටිදුර පැනීම, වේගය හා දරාගැනීම යන අංගයන්ගෙන් සමන්විත වේ.

7.2.2.4 වෙනත් සුදුසුකම් -

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වියයුතුය.

ii. යහපත් චරිතයකින් යුක්ත අයෙකු වියයුතුය.

iii. ආගමික හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තෙකු නොවිය යුතුය.

iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත් වියයුතුය.)

v. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම්, ඔහු හෝ ඇය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

vi. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් සියලු ම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව - අවුරුදු 18ට නොඅඩු වියයුතුය.

7.2.3.2 උපරිම සීමාව - අවුරුදු 35ට නොවැඩි වියයුතුය.

08 FEB 2022

7.2.4 බඳවාගැනීමේ ක්‍රමය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමකින්, ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමකින් හෝ වෙබ් අඩවියේ දැන්වීම් පලකිරීම මගින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් පවත්වනු ලබන අතර, එම තරග විභාගයේ ප්‍රතිඵල මත 40%කට වඩා වැඩි ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ගේ ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

ඒ අනුව ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන්නන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු ලබාගන්නා ඒකාබද්ධ ලකුණු සංඛ්‍යාව අනුව සකසනු ලබන කුසලතා ලේඛනයකට අනුව මෙම තනතුරු සඳහා බඳවාගනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාවට සමාන/අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇතිවිට ඔවුන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ක්‍රීඩා විද්‍යායතනයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට භාජනය කොට ඉන් සමත්වන්නන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලබාගන්නා කුසලතාවය මත තනතුරු සඳහා බඳවාගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය -

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. භාෂා හැකියාව | 100 | 40% |

ඇමුණුම් 01 - ලිඛිත විභාගයෙහි විෂය නිර්දේශය

7.2.4.1.1 පවත්වන බලධරයා - පත්වීම් බලධරයා හෝ පත්වීම් බලධරයා විසින් බලය පවරනු ලබන වෙනත් ආයතනයක්

7.2.4.2 ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය - ශාරීරික යෝග්‍යතාව පිරික්සීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හෝ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වියයුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය පහත අංශයන්ගෙන් සමන්විත ය. ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාව, උදරයේ ශක්තිය, දෑත්වල ශක්තිය, උලඟිතාව, හිටිදුර පැනීම, වේගය හා දරාගැනීම යන අංශයන්ගෙන් සමන්විත වේ.

[illegible] අධ්‍යක්ෂකතුමා විසින් අනුමත කරන ලදී.
[illegible] අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලන නිර්ණායක යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලැබේ.

7.2.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය -

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බැලෙන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | 40% |
| ක්‍රීඩා දක්ෂතාවන් | 70 | |
| ක්‍රීඩා පුහුණු කිරීම, තරග විනිශ්චය/සංවිධානය | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

(ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ ඇමුණුම 02හි දක්වා ඇත)

සටහන:

I. ලිඛිත පරීක්ෂණයෙන් හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

II. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් ඇමුණුම 2හි දක්වා ඇත.

7.2.4.5 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා - පත්වීම් බලධාරියා

7.2.4.6 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පලකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවාගැනීම - අදාළ නොවේ

7.4. කුසලතා පදනම මත බඳවාගැනීම - අදාළ නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

8.කාර්යක්ෂමතා කඩඉිම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉිම ද යන වග | කාර්යක්ෂමතා කඩඉිම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද යන වග | කාර්යක්ෂමතා කඩඉිමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පත්‍ර පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉිම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවාගෙන වසර 3ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 03) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉිම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී II, ශ්‍රේණියට උසස්වී වසර 3ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 04) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉිම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී I, ශ්‍රේණියට උසස්වී වසර 5ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 05) |

08 FEB 2022

8.2. කාර්යක්ෂමතා කඩඉිම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වසරකට දෙවරක් හෝ අවශ්‍යතාව පරිදි

8.3. කාර්යක්ෂමතා කඩඉිම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද?

1 වන කාර්යක්ෂමතා කඩඉිම් පරීක්ෂණය
2 වන කාර්යක්ෂමතා කඩඉිම් පරීක්ෂණය
3 වන කාර්යක්ෂමතා කඩඉිම් පරීක්ෂණය
} පත්වීම් බලධරයා

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

9. භාෂා ප්‍රවීණතාව

9.1.

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.18/2020 හා අනුශංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම

vi. අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 06) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, III වන ශ්‍රේණියේ වසර දහයක සේවා කාලය හෝ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II වන ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.2. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1.සපුරාලිය යුතු සුදුසුකම්

i. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම

ii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

iv. අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 06) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, II වන ශ්‍රේණියේ වසර දහයක සේවා කාලය හෝ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

08 FEB 2022

## 11. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රා.ප.ච. අංක 03/2016 හා ඊට අනුශංගික චක්‍රලේඛ මගින් ලබාදී ඇති වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනා ම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණනය කරනු ලබන්නේ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙන ය. කෙසේ වුව ද අන්තර්ග්‍රහණය හේතුවෙන් තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක වියයුතුය. එසේ ම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදුනොකළ යුතුය.

i. දැනට MT1- 2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණිය යටතේ වැටුප් ලබන ක්‍රීඩා නිලධාරීන් පිළිවෙළින් ප්‍රතිසංවිධිත MT2- 2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට ද

ii. දැනට MT1- 2016 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණිය යටතේ වැටුප් ලබන ක්‍රීඩා නිලධාරීන් පිළිවෙළින් ප්‍රතිසංවිධිත MT2- 2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට ද

iii. දැනට MT1- 2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණිය යටතේ වැටුප් ලබන ක්‍රීඩා නිලධාරීන් පිළිවෙළින් ප්‍රතිසංවිධිත MT2- 2016 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට ද අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

## 12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළයුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14. අර්ථ නිරූපණ:**

**14.1 "සතුටුදායක සේවා කාලය":**

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින් ද, සමත් වියයුතුව තිබූ කාර්යක්ෂමතා කඩයිම් සමත්වීම මගින් ද, සිදුකළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලු ම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදුනොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එය ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී බැහැර කළයුතු වන්නේය.

**14.2. "සක්‍රීය සේවා කාලය":**

"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14.3. "නියමිත දිනට" :**

අදාළ කාර්යක්ෂමතා කඩයිම සමත්විය යුතු දිනය, "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වල දී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩයිම සමත් වන නිලධාරීන්ට බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩයිම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළයුතුය.

උදා : වසර තුනක දී සමත්විය යුතු කාර්යක්ෂමතා කඩයිම වසර හතරකින් සමත් වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස්වීම් ලැබෙනුයේ වසර එකොළහකිනි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

**15.** අන්තර්කාලීන විධිවිධාන

15.1 පැරණි බඳවාගැනීමේ පරිපාටියට අනුව IIIවන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය සමත්වී ඇති නිලධාරීන් මෙම පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති IIIවන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය නියමිත දිනට සමත් වූවා සේ සලකා කටයුතු කරනු ලැබේ.

15.2 පැරණි බඳවාගැනීමේ පරිපාටියට අනුව IIවන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය සමත්වී ඇති නිලධාරීන් මෙම පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති IIවන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය නියමිත දිනට සමත් වූවා සේ සලකා කටයුතු කරනු ලැබේ.

15.3 පැරණි බඳවාගැනීමේ පරිපාටියට අනුව Iවන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය සමත්වී ඇති නිලධාරීන් මෙම පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති Iවන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය නියමිත දිනට සමත් වූවා සේ සලකා කටයුතු කරනු ලැබේ.

15.4 පැරණි බඳවාගැනීමේ පරිපාටියට අනුව නියමිත ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී නොමැති නිලධාරීන් සඳහා මෙම බඳවාගැනීම් පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය සමත්වීමට මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට වසර 3ක සහන කාලයක් ලබාදෙනු ලැබේ.

**16. මෙම පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වෙතොත් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | :- .................... | පරීක්ෂා කළේ | :- .................... |
| නම | - එච්.අයි.එස්. හේවාගම | නම | - රවිකා රත්නායක |
| තනතුර | - කළමනාකරණ සේවා නිලධාරී | තනතුර | - පරිපාලන නිලධාරී |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය - 2021.09. 10

අත්සන - ....................

නම - සෙව්වන්දි හෙට්ටිආරච්චි

තනතුර - ක්‍රීඩා අධ්‍යක්ෂ

නිලමුද්‍රාව

සෙව්වන්දි හෙට්ටිආරච්චි
ක්‍රීඩා අධ්‍යක්ෂ (වැ.බ.)
බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
204, 2 වන මහල, ...

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : WPS/ADM/08/6/372
දිනය : 2022.01.25

08 FEB 2022

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය - 2021.09. 13

අත්සන - ....................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

නිලමුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
204, 2 වන මහල, නව පළාත් සභා සංකීර්ණය, ...

යොමු අංකය - CSWP/PTR/12-5/F.I.I.

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය - 2021/10/08

අත්සන - ..............................

නම - ..............................

ප්‍රධාන ලේකම්

නිලමුද්‍රාව

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

යොමු අංකය - ..............................

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය - 2021/12/17

අත්සන - ..............................

නම - ..............................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිලමුද්‍රාව

ගිලන් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය - GOS/ADM/8/6/372

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය 2022.01.25 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය - 2022.01.25

අත්සන - ..............................

නම - ..............................

ආණ්ඩුකාර ලේකම්

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

නිලමුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය
10 වන මහල, පළාත් සභා සංකීර්ණය
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ඇමුණුම 01

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවාගැනීමේ විවෘත තරග විභාගය</u>

01.විභාගයේ නම : කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවාගැනීමේ විවෘත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර

08 FEB 2022

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01යි | 100 | 40% |
| 2. භාෂා හැකියාව | පැය 02යි | 100 | 40% |

03. විභාගය පවත්වන බලධරයා : පත්වීම් බලධරයා හෝ පත්වීම් බලධරයා විසින් බලය පවරනු ලබන වෙනත් ආයතනයක්

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : අවශ්‍යතාව පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනුම, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| 2. භාෂා හැකියාව | අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන : ..................................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

දිනය - 2021.09.13

නිල මුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
204, 2 වන මහල, නව පළාත් සභා සංකීර්ණය, ඩෙනිසිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවාගැනීමේ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය</u>**

1. පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවාගැනීමේ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

<table>
<tr><th>ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර</th><th colspan="5">උපරිම ලකුණු ප්‍රමාණය</th><th>ලබා දියයුතු උපරිම ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td rowspan="3">අතිරේක අධ්‍යාපන සුදුසුකම්</td><td colspan="2">රජයේ පිළිගත් ආයතනයකින් මාස 06කට නොඅඩු ක්‍රීඩා සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වීම</td><td colspan="3">05</td><td rowspan="3">10</td><td rowspan="11">40%</td></tr>
<tr><td colspan="2">විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ක්‍රීඩා විෂයට අදාල උපාධිය</td><td colspan="3">10</td></tr>
<tr><td colspan="2">(ඉහත සුදුසුකම්වලින් ඉහළ ම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)</td><td colspan="3"></td></tr>
<tr><td rowspan="8">ක්‍රීඩා දක්ෂතාවන්</td><td colspan="2">ජයග්‍රහණ ලබාගත් ස්ථාන</td><td>1</td><td>2</td><td>3</td><td rowspan="8">70</td></tr>
<tr><td colspan="2">පළාත් තරග</td><td>30</td><td>20</td><td>15</td></tr>
<tr><td colspan="2">ජාතික තරග</td><td>45</td><td>40</td><td>35</td></tr>
<tr><td colspan="2">දකුණු ආසියාතික තරග/ ආසියාතික කණිෂ්ඨ තරග</td><td>55</td><td>50</td><td>45</td></tr>
<tr><td colspan="2">ආසියාතික ශූරතා, පොදු රාජ්‍ය මණ්ඩලීය ශූරතා, ලෝක ශූරතා ලෝක කුසලාන තරග</td><td>65</td><td>60</td><td>55</td></tr>
<tr><td colspan="2">ඔලිම්පික් තරග සහභාගීත්වය</td><td colspan="3">70</td></tr>
<tr><td>කණ්ඩායම් තරග</td><td colspan="4">ඉහත තනි තරගයකට ලබාදෙන ලකුණු ප්‍රමාණයෙන් 70%ක ලකුණු ප්‍රමාණයක් ලබා දෙනු ලැබේ.</td></tr>
<tr><td colspan="5">❖ අයදුම්කරු විසින් දක්වා ඇති ඉහළම දක්ෂතාවයට එක්වරක් පමණක් ලකුණු ලබාදීම සිදු කළයුතුය. යම්කිසි අවස්ථාවකදී අයදුම්කරුවන් කිහිපදෙනෙකු අතර ලකුණු සමවීමක් සිදු වූ විටකදී අයදුම්කරුවන් විසින් සපුරා ඇති ඉහළ ම දෙවන දක්ෂතාවයන් පිළිබඳ සලකා බලා ප්‍රමුඛතාවය තීරණය කළයුතුය.</td></tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

| | | | | |
|---|---|---|---|---|
| ක්‍රීඩා පුහුණු කිරීම, තරඟ විනිශ්චය/ සංවිධානය | දිස්ත්‍රික් මට්ටමේ තරග සඳහා ක්‍රීඩකයින් පුහුණු කිරීම, තරග විනිශ්චය හෝ සංවිධානය කිරීම<br>(එක් අවස්ථාවක් සඳහා ලකුණු 1 බැගින් උපරිම අවස්ථා 03) | 03 | 15 | |
| | පළාත් මට්ටමේ තරග සඳහා ක්‍රීඩකයින් පුහුණු කිරීම, තරග විනිශ්චය හෝ සංවිධානය කිරීම<br>(එක් අවස්ථාවක් සඳහා ලකුණු 2 බැගින් උපරිම අවස්ථා 03) | 06 | | |
| | ජාතික මට්ටමේ තරග සඳහා ක්‍රීඩකයින් පුහුණු කිරීම, තරග විනිශ්චය හෝ සංවිධානය කිරීම | 10 | | |
| | ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා ක්‍රීඩකයින් පුහුණු කිරීම, තරග විනිශ්චය හෝ සංවිධානය කිරීම | 15 | | |
| | • ඉහත සඳහන් අවස්ථා අතරින් ඉහළ ම තරගාවලිය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ<br>• මෙම කරුණු සනාථ කිරීම සඳහා විධිමත් තහවුරු කිරීම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතුය. | | | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | | | 05 | |

Provincial Public Service Commission
08 FEB 2022
223

සටහන :

- අයදුම්කරුවන් විසින් සපුරා ඇති ක්‍රීඩා දක්ෂතා සඳහා ලකුණු ලබා දීමේදී ඔවුන් ලබා ඇති අවම සුදුසුකම බඳවාගැනීමේ මූලික සුදුසුකම සේ සැලකිය යුතුය. එසේ කිරීමෙන් අනතුරුව ඔවුන් ලබා ඇති අනෙකුත් දක්ෂතා සඳහා ක්‍රීඩා දක්ෂතාවයන් යටතේ ලබා දී ඇති නිර්ණායක තුළ ලකුණු ලබා දිය යුතුය.

- ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ.

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : පත්වීම් බලධරයා

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : අවශ්‍යතාව පරිදි

අත්සන : ..................................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

දිනය - 2021.09. 13

නිල මුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022 . 01 . 25

ඇමුණුම 03

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ පළමු වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය</u>

1. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ පළමුවන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය

2. විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : III වන ශ්‍රේණියට පත්වී වසර 3ක් ගතවීමට පෙර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම | පැය 01 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : පත්වීම් බලධරයා

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක් හෝ අවශ්‍යතාව පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති පිළිබඳ මූලික දැනුම | 1. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති<br>2. ආයතන සංග්‍රහයේ I-V,VII, XII, XIV, XVII, XXIV පරිච්ඡේද |
| 2. ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම | මළල ක්‍රීඩා හා කණ්ඩායම් ක්‍රීඩා පිළිබඳ නීතිරීති |

අත්සන : ........................................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

දිනය - 2021.09. 13

නිල මුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
204, 2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

08 FEB 2022

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී II වන ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

1. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී II වන ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : II වන ශ්‍රේණියට පත්වී වසර 3ක් ගතවීමට පෙර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| පරිගණක පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විනිසුරු බලපත්‍ර 02ක් ලබා තිබිය යුතුයි. | | | |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : පත්වීම් බලධරයා
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක් හෝ අවශ්‍යතාව පරිදි
5. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පරිගණක පරීක්ෂණය | 1.මයික්‍රොසොෆ්ට් ඔෆිස්<br>2. මයික්‍රොසොෆ්ට් වර්ඩ්<br>3. මයික්‍රොසොෆ්ට් එක්සෙල්<br>4. මයික්‍රොසොෆ්ට් පවර් පොයින්ට් (මෘදුකාංග මෙහෙයවීම)<br>5. අන්තර්ජාලය භාවිතය පිළිබඳ මූලික දැනුම |
| විනිසුරු බලපත්‍ර | අදාළ ජාතික ක්‍රීඩා සම්මේලනය/සංගමය විසින් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා නිකුත් කර තිබිය යුතුය. |

❖ <u>සටහන</u>:

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉහත සඳහන් පරිගණක පරීක්ෂණයට අදාල විෂය නිර්දේශය ඇතුලත් මාස 06කට නොඅඩු පරිගණක සම්බන්ධ පාඨමාලාවක් හදාරා තිබීම මත පරිගණක පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට පත්කිරීමේ බලධරයාට හැකිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : බ්‍රපස/ADM/05/6/372
දිනය : 2022.01.25

අත්සන : ..............................
නම - සිරිසෝම ලොකුවිතාන
තනතුර - අමාත්‍යාංශ ලේකම්
දිනය - 2021.09.12
නිල මුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරි I වන ශ්‍රේණියේ තුන්වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය**

1. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී Iවන ශ්‍රේණියේ තුන්වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය

2. විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : I වන ශ්‍රේණියට පත්වී වසර 5ක් ගතවීමට පෙර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| පුහුණු න්‍යායයන් පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40% |

3 විභාගය පවත්වනු ලබන බලධරයා : පත්වීම් බලධරයා

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක් හෝ අවශ්‍යතාව පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | මුදල් රෙගුලාසි IV, V, VI, IX පරිච්ඡේද |
| පුහුණු න්‍යායයන් පිළිබඳ සාමාන්‍ය දැනුම | පුහුණු මූලධර්ම, පුහුණු ක්‍රම පිළිබඳ දැනුම |

අත්සන : ..............................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

දිනය - 2021.09.13

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ගොනු අංකය : GOS/ADM/08/6/372

දිනය : 2022.01.25

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යොවුන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
204, 2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

221

ඇමුණුම 06

ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම් පත්‍රය

08 FEB 2022

Provincial Public Service Co...

1. නිලධරයා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..............................

1.2 හැඳුනුම්පත් අංකය : ..............................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..............................

1.4 අයත් වන ශ්‍රේණිය හා තනතුර : ..............................

1.5 අයත් වන සේවා ගණය හා ශ්‍රේණිය : ..............................

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය : ..............................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..............................

2.3 සමත්වූ කාර්යක්ෂමතා කඩයිම හා සමත් දිනය :

| සමත්වූ කාර්යක්ෂමතා කඩඉයිම | සමත්විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් වියයුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1/විශේෂ

3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය / සුවිශේෂී

3.3.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? ඔව් / නැත

3.3.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..............................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25

4. <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් ........................................................................................................ මහතා/මෙනවිය/මහත්මිය ...................................................................................සේවා ගණයේ .......... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................

5. <u>අමාත්‍යංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................

6. <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් / පත්වීම් බලධරයා</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ........................................................ මහතා/මහත්මිය/මෙනවිය .................................................... සේවා ගණයේ ........... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ .................................. දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................
(පරිපාලන බලධරයා)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/372
දිනය : 2022.01.25